අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சு
Ministry of Education, Higher Education and Vocational Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்லை, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ යොමුව<br>எனது இல.<br>My Ref. | ED/12/1/2/22 | ඔබේ යොමුව<br>உமது இல.<br>Your Ref. | | දිනය<br>திகதி<br>Date | 2025.02. 20 |

**අභ්‍යන්තර චක්‍රලේඛ අංක : 37/2024**

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ විධායක සේවා ගණයේ III වන ශ්‍රේණියේ සියලුම නීති නිලධාරීන් වෙත

<u>අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ විධායක සේවා ගණයේ III වන ශ්‍රේණියේ නීති නිලධාරීන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2024(2025)</u>

2013.03.05 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ විධායක සේවා ගණයේ (SL 01-2016) නීති නිලධාරි තනතුර සඳහා වන බඳවා ගැනීමේ පටිපාටිය සහ ඊට පසුව කරන ලද සංශෝධනවලට අනුව අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ විධායක සේවා ගණයේ III වන ශ්‍රේණියේ නීති නිලධාරීන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය 2025 ජුනි මාසයේදී විභාග කොමසාරිස් ජනරාල් විසින් කොළඹදී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. විභාග පරිපාටිය : විභාගය සඳහා පහත සඳහන් විෂයන් ඇතුළත් වේ.
    1. ආයතන සංග්‍රහය
    2. මුදල් රෙගුලාසි

නිර්දේශ පත්‍රිකාව: පහත සඳහන් විෂය කරුණු පිළිබඳ අයදුම්කරුවන්ගේ දැනුම පරීක්ෂා කරනු ලැබේ.

1) ආයතන සංග්‍රහය (පැය 01ක ව්‍යුහගත ප්‍රශ්න ඇතුළත් පත්‍රයකි.)

| | | | |
|---|---|---|---|
| II | වන පරිච්ඡේදය | - | සේවයට බඳවා ගැනීමේ ක්‍රියා පරිපාටිය සහ පත්කිරීම් |
| IV | වන පරිච්ඡේදය | - | මාස් පඩි, තාවකාලික තත්ත්වය සහ විශ්‍රාම වැටුප් හිමිකම් ප්‍රදානය කිරීම |
| V | වන පරිච්ඡේදය | - | මුදා හැරීම, කලින් දැරූ තනතුරට පෙරළා යැවීම හා සේවය අවසන් කිරීම |
| VII | වන පරිච්ඡේදය | - | වැටුප් |
| VIII | වන පරිච්ඡේදය | - | අතිකාල දීමනා, නිවාඩු දවස් සහ නිවාඩු දවස් සඳහා වැටුප් හා දීමනා |
| XII | වන පරිච්ඡේදය | - | නිවාඩු |
| XIII | වන පරිච්ඡේදය | - | දූමරිය බලපත්‍ර |
| XIV | වන පරිච්ඡේදය | - | දිවයින ඇතුළත රාජකාරී ගමන් |
| XVI | වන පරිච්ඡේදය | - | නිවාඩු ගමන් |
| XIX | වන පරිච්ඡේදය | - | රජයේ නිවාස |
| XXVIII | වන පරිච්ඡේදය | - | පරිපාලන කාර්යය පරිපාටිය හා විධි |
| XXX | වන පරිච්ඡේදය | - | රජයේ නිලධාරීන් සම්බන්ධයෙන් ආණ්ඩුව සතු බලතල |
| XLVII | වන පරිච්ඡේදය | - | සාමාන්‍ය හැසිරීම හා විනය |

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති සංග්‍රහය



CamScanner

2) මුදල් රෙගුලාසි (පැය 01ක ව්‍යුහගත ප්‍රශ්න ඇතුළත් පත්‍රයකි.)

| | | | |
|---|---|---|---|
| I | වන පරිච්ඡේදය | - | ඒකාබද්ධ අරමුදල, වාර්ෂික ඇස්තමේන්තු, වාර්ෂික ඇස්තමේන්තු වෙනස් කිරීම |
| II | වන පරිච්ඡේදය | - | පාඩු හා අත්හැර දැමීම |
| III | වන පරිච්ඡේදය | - | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන්, ආදායම් ගිණුම් නිලධාරීහු ගෙවීම සඳහා බලය දීම, අනුමත කිරීම, සහතික කිරීම, ගෙවීම |
| IV | වන පරිච්ඡේදය | - | රාජ්‍ය අරමුදල් භාරකාරත්වය, ගෙවීම් සහ ලැබීම් සම්බන්ධව ක්‍රියාවලිය, අගරු වෙක්පත් ගෙවීම් ක්‍රියාවලිය |
| VI | වන පරිච්ඡේදය | - | රාජ්‍ය මුදල්වල භාරකාරත්වය, සමීක්ෂණ මණ්ඩල, අයිරාවන්, බැංකු ගිණුම් |
| XIII | වන පරිච්ඡේදය | - | වැඩ හා සේවා, ගබඩා තොග හරි වැරදි බැලීම, භාර ගැනීම, ලබා ගැනීම හා සැපයීම් පිළිබඳ කාර්යය පටිපාටිය |

රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය

සටහන:

එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා හිමි මුළු ලකුණු සංඛ්‍යාව 100කි. සමත් වීම පිණිස එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා හිමි මුළු ලකුණුවලින් අවම වශයෙන් 40%ක් ලබාගත යුතුය.

03. මෙම විභාගය සඳහා සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි භාෂාවෙන් පෙනී සිටිය හැකිය. අයදුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

04. (1) අයදුම්පත්, අමුණා ඇති ආකෘතිය අනුව A4 ප්‍රමාණයේ කඩදාසියේ දෙපැත්තම ප්‍රයෝජනයට ගෙන සකස් කර තම අත් අකුරින් සම්පූර්ණ කර ඉදිරිපත් කළ යුතු අතර අයදුම්පතේ ශීර්ෂ අංක 01 සිට 07 යටතේ වූ ශීර්ෂ පළමුවන පිටුවට ද ඉතිරිය දෙවන පිටුවට ද ඇතුළත් වන පරිදි පිළියෙල කර ගත යුතුය. තව ද අයදුම්පත පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල / දෙමළ භාෂාවෙන් සම්පූර්ණ කරන අයදුම්පත්වල සිංහල /දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන් සම්පූර්ණ කිරීම අවශ්‍ය වේ. එසේම නිවේදනයේ ඇතුළත් ආදර්ශ අයදුම්පතට අනුකූල නොවන හා අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරන බැවින් අයදුම්පත යොමු කිරීමට ප්‍රථම එය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පතට අනුකූල ද යන්න හා සියලු තොරතුරු ඇතුළත් කොට අයදුම්පත නිවැරදිව සම්පූර්ණ කර තිබේ ද යන්න පිළිබඳවත්, නියමිත විභාග ගාස්තුව ගෙවා එහි විස්තර අයදුම්පතට ඇතුළත් කර ලදුපත අලවා තිබේ ද යන්න පිළිබඳවත්, නැවත විමසිලිමත් විය යුතුය. තව ද සම්පූර්ණ කරන ලද අයදුම්පතේ ඡායා පිටපතක් හා විභාග ගාස්තුවට අදාළ ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

(2) ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම්:- අයදුම්පත පිරවීමේදී ඉතා සැලකිලිමත්ව සත්‍ය හා නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මෙම විභාගයේ නීතිරීති අනුව යම් අපේක්ෂකයකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාව අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය.



CamScanner

05. මෙම විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවා ඇති නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදු වනු ඇත. තව ද විභාගයට පෙනී සිටින අපේක්ෂකයින් විසින් විභාගය සඳහා පෙනී සිටින පළමු දිනයේදීම විභාග ශාලාධිපති වෙත ඔවුන්ගේ අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතු අතර එවැනි ප්‍රවේශ පත්‍ර නොමැතිව විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ.

06. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය වන 2025.03.28 දිනට හෝ ඊට ප්‍රථම තම අංශ ප්‍රධානීන් මාර්ගයෙන් අමාත්‍යාංශයේ සාමාන්‍ය ආයතන (ඒකාබද්ධ සේවා) ශාඛාවට එවිය යුතුය. මේ දිනට පසුව ලැබෙන කවර අයදුම්පතක් වුව ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

07. මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කර ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තු නිල වෙබ් අඩවියේ පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 2ක් හෝ 3ක් ගත වූ පසුවත් තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම්, දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේදී අයදුම්කරු තමා ඉල්ලුම් කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවකු නම් එම විස්තර සමග, ෆැක්ස් මගින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් කඩිනමින් ලබා ගැනීමට හැකි අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් සඳහන් කර ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායි වනු ඇත. එසේ විමසීමේදී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින යම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබා ගත් අයදුම්පතේ පිටපත, විභාග ගාස්තු ගෙවීම අදාළ නම් ඊට අදාළ ලදුපතේ පිටපත හා අයදුම්පත තැපැල් කිරීමේදී ලියාපදිංචි කළ කුවිතාන්සිය සූදානමින් තබා ගැනීම ද ප්‍රයෝජනවත් වනු ඇත.

08. අනන්‍යතාව: - විභාග අයදුම්කරුවන් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත් වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන ලේඛන පමණක් වලංගු වේ.

(අ) ජාතික හැඳුනුම්පත

(ආ) වලංගු විදේශ ගමන් බලපත්‍රය

(ඇ) වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය

එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකි පරිදි මුහුණ හා විද්‍යුත් සන්නිවේදන උපාංග පැළඳගෙන නොමැති බව තහවුරු කර ගත හැකි වන පරිදි දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිට වන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.



CamScanner

09. අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට හෝ තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

10. අයදුම්පතේ ද විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා සහතික කරවා ගත යුතුය.

11. මෙම විභාගයට අයදුම්කරන අපේක්ෂකයින්ගෙන් පහත සඳහන් පදනම මත ගාස්තු අය කරනු ලැබේ.

| | | |
|---|---|---|
| (අ) | පළමු වතාවට (සම්පූර්ණ විභාගය හෝ කොටස් සඳහා) ගාස්තු අය නොකෙරේ. | |
| (ආ) | ඉන්පසු එක් එක් වතාවට සම්පූර්ණ විභාගය සඳහා | රු.500.00 |
| (ඇ) | එක් විෂයකට | රු.250.00 |
| (ඇ) | විෂයන් දෙකකට හෝ ඊට වැඩි ගණනකට | රු.500.00 |

මෙම විභාග ගාස්තු විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 20-03-02-13 ට බැර වන සේ දිවයිනේ ඕනෑම තැපැල්/ උප තැපැල් කාර්යාලයකට ගෙවා අයදුම්කරුගේ නමින් ලබා ගන්නා ලදුපත අයදුම්පතේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ එහි දාරයක් ඇලවිය යුතුය. විභාග ගාස්තුව සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාරගනු නොලැබේ. විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව මොනම හේතුවක් මත ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් නොකෙරේ. එසේම ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකි ය.

12. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් වූ මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් ඇති වන බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

නාලක කලුවැව
ලේකම්
අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය



CS CamScanner

ආදර්ශ අයදුම්පත

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ විධායක සේවා ගණය - නීති නිලධාරි III ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2024(2025)

Executive Service Category of the Ministry of Education, Higher Education and Vocational Education – Second Efficiency Bar Examination for Grade II Legal Officers – 2024(2025)

01. විභාගයට ඉදිරිපත් වන භාෂා මාධ්‍යය : ☐ ☐

සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4 (අදාළ අංකය කොටුව තුළ ලියන්න.) (කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි.)

02. (i) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්): ..........................................................................

(උදා: HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

(ii) අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොදා නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්):..........................................................................

(උදා: GUNAWARDHANA, H.M.S.K.)

(iii) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්): ..........................................................................

03. කාර්යාලයීය ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)..........................................................................
..........................................................................

(ප්‍රවේශ පත්‍රය මෙම ලිපිනයට තැපැල් කරනු ලැබේ.)

04. ස්ත්‍රී/ පුරුෂ භාවය : ☐ පුරුෂ - 0
ස්ත්‍රී - 1

05. ජාතික හැඳුනුම්පත් අංකය: ☐☐☐☐☐☐☐☐☐☐☐☐

06. දුරකථන අංකය: කාර්යාලයීය: ☐☐☐☐☐☐☐☐☐☐

ජංගම: ☐☐☐☐☐☐☐☐☐☐

07. විභාගයට ඉදිරිපත් වීමට ඉල්ලා සිටින විෂයයන්:

| විෂය අංකය | විෂයය |
|---|---|
| ..................... | ............................. |
| ..................... | ............................. |



CamScanner

08. මීට ප්‍රථම මෙම විභාගයට මුළුමනින්ම හෝ කොටසක් වශයෙන් හෝ පෙනී සිට ඇත්දැයි සඳහන් කරන්න. පෙනී සිට ඇත්නම් විෂයන්, වර්ෂය හා මාසය ද සඳහන් කරන්න.

| විභාගය | විෂයය | වර්ෂය හා මාසය |
|---|---|---|
| | | |
| | | |

09. අධ්‍යාපන අමාත්‍යාංශයේ නීති නිලධාරි තනතුරට ඇතුළත් වූ දිනය:

වර්ෂය | | | | | මාසය | | | දිනය | | |

10. ගෙවන ලද විභාග ගාස්තුව : රු.............................
ගෙවූ දිනය :...............................
ලදුපත් අංකය :...................................
ගෙවන ලද තැපැල්/ උප තැපැල් කාර්යාලය :..........................................

| (ලදුපත නොගැලවෙන සේ එහි එක් දාරයකින් මෙහි අලවන්න.) |
|---|

11. ඉහත සඳහන් තොරතුරු නිවැරදි බවත්, ඉල්ලා ඇති භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමට මා හට හිමිකම් ඇති බවත්, ප්‍රකාශ කරමි. ප්‍රථම වතාවට මෙම විභාගයට පෙනී සිටින බව*/ විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට නොවන බැවින්, අදාළ විභාග ගාස්තුව ගෙවන ලද බවත්, ඊට අදාළ ලදුපත අමුණා ඇති බවත් * ප්‍රකාශ කරමි.(* අදාළ නොවන වචන කපා හරින්න.) තව ද විභාගය පැවැත්වීම හා එහි ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් ගනු ලබන තීරණවලට මම යටත් බව ද ප්‍රකාශ කරමි.

.................................                                        .................................
දිනය                                        අයදුම්කරුගේ අත්සන

12. අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන ලේකම්

මෙහි විස්තර දැක්වෙන අයදුම්කරු / අයදුම්කාරිය ............................. දින මා ඉදිරිපිට අත්සන් කළ බව සහතික කරමි.

................................                                        ......................................................
දිනය:                                        සහතික කරන නිලධාරියාගේ අත්සන
(නිල මුද්‍රාව තබන්න.)

13. විභාග කොමසාරිස් ජනරාල්,

මෙහි විස්තර දැක්වෙන අයදුම්කරුට / අයදුම්කාරියට, ඔහු / ඇය විසින් මෙහි දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ඇති බවත්, ප්‍රථම වතාවට මෙම විභාගය සඳහා අයදුම් කරන බැවින් විභාග ගාස්තුවෙන් නිදහස් බවත් / නියමිත ගාස්තුව ගෙවා එම ලදුපත මෙහි අලවා ඇති බවත් සහතික කරන අතර අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

................................                                        ......................................................
දිනය:                                        ආයතන ප්‍රධානියාගේ අත්සන හා පදවි නාමය
(නිල මුද්‍රාව තබන්න.)



CS CamScanner